**කෘෂි තාක්ෂණ අංශයේ විෂය පථයන් වලට අදාල තොරතුරු පවත්වාගෙන යනු ලබන කාර්යයන්.**

1. කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා අරමුදල් සපයන පර්යේෂණ ව්‍යාපෘති පරිපාලනය.
2. කෘෂි යෙදවුම් / කෘෂි භාණ්ඩ ආනයන සහ අපනයනය කාර්යයේ දී බලපත්‍ර ලබාදීම, තීරු බදු නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම ආදිය.
3. කෘෂිකාර්මික අණ පනත් ක්‍රියාත්මක කිරීමේ දී කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම.
4. ගස් හෙලීමේ පනත යටතේ ගස් 15ට වැඩි අවස්ථා වලදී අනුමැතිය ලබා දීම.
5. දුම්කොළ වගාව ඉවත් කර එම ඉඩම් වල විකල්ප බෝග හදුන්වාදීමේ වැඩසටහන.

**1. කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් අරමුදල් සපයන ව්‍යාපෘති**

1.1. **කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත අරමුදල් සපයන ව්‍යාපෘති.**

| අනු අංකය | ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කාලය | ඇස්තමේන්තුගත මුදල | ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | වගකීම දරන නිලධාරීන්ගේ විස්තර |
|---|---|---|---|---|---|
| (1) | උතුරු පලාත තුළ ගුණාත්මක බීජ නිශ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා පරන්තන්හි පර්යේෂණාගාරයට පහසුකම් සැපයීම | 2018 | 20.50 | බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය (SCPPC) බීජ සහතික කිරීමේ සේවය | ආචාර්ය ලක්මිණි ප්‍රියන්තා මහත්මිය |
| (2) | සුදුසු රෝපණ ද්‍රව්‍ය සංවර්ධනය හා සීඩ් ෆිල්ම් කෝටින් ක්‍රමය සංවර්ධනය | | 2.0 | (SCPPC) බීජ සහතික කිරීමේ සේවය | ආචාර්ය ලක්මිණි ප්‍රියන්තා මහත්මිය |
| (3) | පරිසර හිතකාමී පළිබෝධ කළමණාකරන ක්‍රම වේද දිරිගැන්වීම | | 1.5 | (SCPPC)පැළෑටි සංරක්ෂණ සේවය | එස්.එස්. වැලිගමගේ මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ) |
| (4) | ගුණාත්මක බීජ හා රෝපන ද්‍රව්‍ය සුලබතාව වැඩි කිරීම | | 4.3 | පළතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය | ආචාර්ය ෂිරෝමනී මහත්මිය/ පී.ඒ නිමල් චන්ද්‍රසිරි මහතා |
| (5) | ආහාර බෝගවල වගාවේ අවශ්‍යතාවයට අනුව පොහොර භාවිතය. | | 10.0 | උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (HORDI) | පී වීරසිංහ මහතා (පර්යේෂණ නිලධාරී) |
| (6) | ප්‍රධාන රෝග හා පළිබෝධ වර්ග කළමණාකරණයට BIPM වැඩසටහන ක්‍රියාත්මක කිරීම. | | 4.0 | (HORDI) | ප්‍රභාත් නිශාන්ත මහතා (පර්යේෂණ නිලධාරී) |

**1.2. කෘෂිකර්ම අමාත්‍යංශය මගින් පශු අස්වනු තාක්ෂණ ආයතනය වෙත අරමුදල් සපයන ව්‍යාපෘති.**

| | පර්යේෂණය | ක්‍රියාත්මක කාලය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | වගකීම දරන නිලධාරීන්ගේ විස්තර |
|---|---|---|---|---|---|
| 1 | කුරුඳු සහසාදික්කා තෙල් නිස්සාරක භාවිතාකරමින් ආහාර පරික්ෂකයක් නිපදවීම. | 2018 | 0.57 | පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය (IPHT) | ජී.ඊ.ඩී.ඒ.එම්.ජයරත්න |
| 2 | ශ්‍රීලංකාවේ පාරම්පරික සහල් වර්ගවල පවතින ආහාර තන්තු සහ ප්‍රතිරෝධී පිෂ්ඨයන් ගේ ප්‍රිබයෝටික විභවය සහ ආහාර කර්මාන්තය සඳහා එහි භාවිතය. | | 1.05 | | කේ.ඩී.ටී.හෙට්ටිගේ |
| 3 | ගබඩා කළ බඩඉරිඟුවල කෘමිහානිය හා ගුණත්වය කෙරෙහි පැඟිරි පත්‍රජලීය යූෂයේ බලපෑම. | | 0.195 | | ඩී.ටී.එච්.පී.රත්නවීර |
| 4 | අධි ශීත පරිරක්ෂකතා කියාවලිය වැඩිදියුණුකිරීම (කැරට්,බෝංචි,බීට්රූට්). | | 0.5252 | | ටී.එම්.ඒ.එන්.වීරසිංහ |
| 5 | නැවුම් අඹ සිසිලනය සඳහා ශීත කළ වායුව ගලායන උපකරණයක් නිර්මාණය කිරීම සහ ගොඩනැගීම. | | 0.53 | | සී.කේ.මාරසිංහ |
| 6 | අඹ බෝගයේ පසු අස්වනු ගුණත්වය හා ගබඩා කාලය දීර්ඝකිරීම සඳහා පූර්ව ප්‍රතිකාරල බලපෑම අධ්‍යයනය කිරීම. | | 0.564 | | එස්.එස්.කේ.වීරසිංහ |
| 7 | නෙළුම් මල්වල ගුණාත්මකභාවය හා පසුඅස්වනු ආයුකාලය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමවේදයන් හඳුනාගැනීම සහ සංවර්ධනයකිරීම. | | 0.451 | | ඩබ්ලිව්.බී.ඩබ්ලිව්.එම්.ආර්.සී.පී.අලුවිහාරේ |
| 8 | අඹවල පසුඅස්වනු රෝග පාලනය කිරීම සඳහා ජෛව පලිබෝධකයන් යොදාගැනීම. | | 1.23 | | ජී.ඩී.එන්.මැණිකේ |
| 9 | අඹ සැපයුම් දාමයේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා භූවිද්‍යාත්මක උපකරණ භාවිතා කිරීමේ ශක්‍යතා විශ්ලේෂණය" ඕමාරගොල්ල අඹ එකතුකරන්නන් ඇසුරින් සිද්ධි අධ්‍යයනයක් | | 0.423 | | වයි.එම්.පී.සමරසිංහ |
| 10 | නැවුම් පළතුරු කල්තබාගැනීම සඳහා ශීතවියළීම සහ රික්ත ඇසුරුම් තාක්ෂණයෙහි ඵලදායීතාව ඇගයීම (පේර,අන්නාසි,ගස්ලබු) | | 3.698 | | බී.ඒ.එම්.එස්.කුමාර |
| 11 | රනිල බෝග පදනම්කර, ප්‍රතිඔක්සිකාරක ගුණය වැඩිදියුණුකළ හා අගය එකතුකළ ග්‍රැනෝලාබාර් (ධාන්‍යාමයආහාරය) සැකසීම | | 0.6725 | | එච්.ආර්.එම්.ජී.සී.තිලකරත්න |
| 12 | පළතුරුවල නියමිත පරිනත අවස්ථා හඳුනාගැනීම සඳහා අවම පිරිවැයක් සහිත උපකරණයක් සැලසුම්කිරීම හා නිර්මාණයකිරීම | | 0.474 | | වයි.ජී.හරිශ්චන්ද්‍ර |

**1.3. කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව හරහා ජාතික විශව විද්‍යාල වෙත අරමුදල් සපයන ව්‍යාපෘති.**

| පර්යේෂණය | ක්‍රියාත්මක කාලය | වෙන්කල ප්‍රතිපාදන (රු.මි) | ක්‍රියාත්මක කරන ආයතනය | වගකීම දරන නිලධාරීන් |
|---|---|---|---|---|
| 1. ධාරක පරපෝෂිත හා මූල පරපෝෂිත අතර යාන්ත්‍රණය අධ්‍යනය හා ඉන් සකසන ලද දාරක ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම. | 2018 | 1.38 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | ආචාර්ය. සී. පී. ජී.. බණ්ඩාරනායක |
| 2. ශ්‍රී ලංකාවේ ජනප්‍රිය වැඩිදියුණු කරණ ලද වී ප්‍ර භේද වල බීජ දිරිය පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම හා ඒවා ගබඩාකරණයේදී දිරිය පවත්වා ගැනීම. | 2018 | 0.6085 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | ආචාර්ය. එස්. එන්. ගමආරච්චිගේ |
| 3. ජල ධාරා මට්ටමේ කාබන් සහ පාංශු පොස්පරස් ප්‍රමාණය විස්තර සැකසීම | 2018 | 0.34 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | ආචාර්ය. ඩබ්. ඒ. පී. විතාරන |
| 4. හරිතාගාර තුල එළවළු නිෂ්පාදනයේදී යෙදවුම් භාවිත කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ ආහාර සුරක්ෂිතතාවය සඳහා තාක්ෂණ සංවර්ධනය. | 2018 | 0.531 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | ආචාර්ය. ඩබ්. ඒ. පී. වීරක්කොඩි |
| 5. කෘෂිකර්මාන්තයේ පළිබෙ පාලනය සඳහා ආක්‍රමණික හා ආගන්තුක ශාක යොදා ගැනීම | 2018 | 1.351 | පශ්චාත් අධ්‍යාපන උපාධි ආයතනය | මහාචාර්ය බී.එම්. රත්නායක බණ්ඩාර |
| 6. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ වල කාබනික ආහාර මිලදී ගැනීමේදී පාරිභෝගික හැසිරීම් කෙරෙහි බලපාන සාධක විශ්ලේෂණය කිරීම.. | 2018 | 0.235 | සබරගමුව විශ්ව විද්‍යාලය | ආචාර්ය. එස්. එච්. පී. මල්කාන්ති |
| 7. ශ්‍රී ලංකාවේ වී වගාවේදී පළිබෝධ නාශක භාවිත රටාව, ගොවීන්ගේ සෞඛ්‍ය හා පාරිසරය කෙරෙහි ඇතිකරන බලපෑම ඇගයීම. | 2018 | 0.926375 | වයඹ විශ්ව විද්‍යාලය | ආචාර්ය. එස්.එන්. ටී ද සිල්වා |
| 8. වැලිමඩ හා බොරගස් ප්‍රදේශයන්ගේ බෝංචි ඉහල අස්වනු හා සුළං ප්‍රතිරෝධී බව සඳහා වැඩිදියුනු කිරීමේදී සහභාගිත්ව අභිජනන ක්‍රමවේද යොදාගැනීම. | 2018 | 0.93 | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය | ආචාර්ය. එම්. ආර්. එ අල්විස්. |
| 9. හෝර්ටන්තැන්න ජාතික උද්‍යානයේ වන විනාශය ඇස්තමේන්තු කිරීම හා පුනර්වර්ධන විභවය නිමානය කිරීම. | 2018 | 0.6237 | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය | ආචාර්ය. සිසිර එදිරිවීර |
| 10. වැඩි දියුණු කළ ෆොස්පරස් පෝෂණය සඳහා ජෛව පොහොර වැඩි දියුණු කිරීම | 2018 | 0.46 | කොළඹ විශ්ව විද්‍යාලය | ආචාර්ය.සී. එම් නානායක්කාර |
| 11. ගබඩාකල නිෂ්පාදන වල කෘමීන් කෙරෙහි අඩු අවදානම් - කෘමිනාශක වල බලපෑම | 2018 | 2.52 | රජරට විශ්ව විද්‍යාලය | ආචාර්ය. වොලී විජේරත්න |

**2. කෘෂි යෙදවුම් / කෘෂි භාණ්ඩ ආනයන සහ අපනයනය කාර්යයේ දී බලපත්‍ර ලබාදීම, තීරු බදු නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම**

**2. I.ආනයන තීරු ගාස්තු වලින් නිදහස් කිරීම**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂන පනතට අනුව 2015 නොවැම්බර් මස 20 වැනි දින අංක 1941/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අදාලව කෘෂි කර්මාන්තය හා ඒ ආශ්‍රිත කටයුතු සඳහා යොදා ගැනීමට ආනයනය කරන පහත සඳහන් ආම්පන්න ආනයන තීරු ගාස්තු වලින් නිදහස්ව ආනයනය සඳහා බලපත්‍ර ලබා ගැනීමට අදාල නිර්දේශිත ලිපි ලබා දීම.

**ආනයන තීරු ගාස්තු වලින් නිදහස් ආම්පන්න**

1. කාලගුණ ඒකක
2. හරිතාගාර
3. පොලිතීන් ගෘහ
4. දිය/තුහින ඉසින යන්ත්‍ර
5. බිංදු වැස්සුම් වාරි පද්ධති
6. පොහොර කිරීමේ පද්ධති
7. පස් රහිතව පැළ වැවීමේ ක්‍රියාවලියට (හයිඩ්රොපොනික්) යොදා ගන්නා පද්ධති
8. උෂ්ණත්ව පාලන හා වාතාශ්‍රය ලබා දෙන පද්දති හා ඒවායේ කොටස් හා අමුද්‍රව්‍ය
9. වසුන් ආස්තර
10. පොකුණු ආස්තරන
11. ආවරන දෑ.

**ඉහත සඳහන් ආම්පන්න ආනයන තීරු ගාස්තු වලින් නිදහස්ව ආනයනය සඳහා නිර්දේශිත ලිපි ලබා ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතු ලිපි**

1. **ඉල්ලුම් කිරීමේ ලිපිය**
2. **ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ලිපිය**
3. **ආනයන තීරු ගාස්තු වලින් නිදහස් කිරීමට අදාල අයදුම්පත් 03 ක් (Application for Duty)**
4. **සැපයුම්කරුගෙන් ලබා ගත් වානිජ ඉන්වොස් (Commercial Invoice) 03 ක්**
5. **ආනයන කරන ආම්පන්න වල සහ සැපයුම්කරුගේ විස්තර**

**i. සෙස් බදු වලින් නිදහස් භාණ්ඩ**

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතට අනුව 2014 ඔකතෝබර් මස 24 වැනි දින අංක 1885/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අදාලව කෘෂි කර්මාන්තය හා ඒ ආශ්‍රිත කටයුතු සඳහා යොදා ගැනීමට ආනයනය කරන පහත සඳහන් ආම්පන්න **සෙස් බදු වලින්** නිදහස්ව ආනයනය සඳහා බලපත්‍ර ලබා ගැනීමට අදාල නිර්දේශිත ලිපි ලබා දීම.

**සෙස් බදු වලින් නිදහස් ආම්පන්න**

1. කාලගුණ ඒකක
2. හරිතාගාර
3. පොලිතීන් ගෘහ
4. දිය/තුහින ඉසින යන්ත්‍ර
5. බිංදු වැස්සුම් වාරි පද්ධති
6. පොහොර කිරීමේ පද්ධති
7. පස් රහිතව පැළ වැවීමේ ක්‍රියාවලියට (හයිඩ්රොපොනික්) යොදා ගන්නා පද්ධති
8. උෂ්ණත්ව පාලන හා වාතාශ්‍රය ලබා දෙන පද්දති හා ඒවායේ කොටස් හා අමුද්‍රව්‍ය
9. වසුන් ආස්තර
10. පොකුණු ආස්තරන
11. ආවරන දෑ .

**ඉහත සඳහන් ආම්පන්න ආනයන තීරු ගාස්තු වලින් නිදහස්ව ආනයනය සඳහා නිර්දේශිත ලිපි ලබා ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතු ලිපි**

1. **ඉල්ලුම් කිරීමේ ලිපිය**
2. **ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ලිපිය**
3. **සැපයුම්කරුගෙන් ලබා ගත් වානිජ ඉන්වොස් (Commercial Invoice) 03 ක්**
4. **ආනයන කරන ආම්පන්න වල සහ සැපයුම්කරුගේ විස්තර**

ii. එකතු කළ අගය මත බදු (VAT) **වලින් නිදහස් භාණ්ඩ**

iii. 2012 අංක 7 දරන ආදායම් සංරක්ෂන පනතට අනුව කෘෂි කර්මාන්තය හා ඒ ආශ්‍රිත කටයුතු සඳහා යොදා ගැනීමට ආනයනය කරන පහත සඳහන් ආම්පන්න එකතු කළ අගය මත බදු (VAT) **වලින්** නිදහස්ව ආනයනය සඳහා බලපත්‍ර ලබා ගැනීමට අදාල නිර්දේශිත ලිපි ලබා දීම.
එකතු කළ අගය මත බදු (VAT) **නිදහස් ආම්පන්න**

1. හරිතාගාර
2. පොලිතීන් ගෘහ
3. පොලිතීන් ගෘහ ගොඩනැගීමට අවශ්‍ය අමුද්‍රව්‍යය

**ඉහත සඳහන් ආම්පන්න** එකතු කළ අගය මත බදු (VAT) **වලින් නිදහස්ව ආනයනය සඳහා නිර්දේශිත ලිපි ලබා ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතු ලිපි**

1. **ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ ලිපිය**
2. **සැපයුම්කරුගෙන් ලබා ගත් වානිජ ඉන්වොස් (Commercial Invoice) 03 ක්**
3. **ආනයන කරන ආම්පන්න වල සහ සැපයුම්කරුගේ විස්තර**
4. **ඉල්ලුම් කිරීමේ ලිපිය**

**2018 වර්ෂයේ සෙස් බදු සහන සඳහා ලබාදුන් නිර්දේශ**

**සෙස් බදු - ප්‍රතිශතය**

| දිනය | අනුක්‍රමික අංකය | සෙස් බදු සහන ලබාදුන් ආම්පන්න |
|---|---|---|
| | | |
| | | |

**2018 වර්ෂයේ භාන්ඩ මත අගය එකතු කල බදු සහන සඳහා ලබාදුන් නිර්දේශ**

**භාන්ඩ මත අගය එකතු කල බදු - ප්‍රතිශතය**

| දිනය | අනුක්‍රමික අංකය | භාන්ඩ මත අගය එකතු කල බදු සහන ලබාදුන් ආම්පන්න |
|---|---|---|
| | | |
| | | |

**2018 වර්ෂයේ තීරු බදු සහන සඳහා ලබාදුන් නිර්දේශ**

**භාන්ඩ මත අගය එකතු කල බදු - ප්‍රතිශතය**

| දිනය | අනුක්‍රමික අංකය | තීරු බදු සහන ලබාදුන් ආම්පන්න |
|---|---|---|
| | | |
| | | |

**3. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකර්ම අමාත්‍යාංශයේ පරිපාලනයට යටත් වන අණ පනත් හා ඒවා ක්‍රියාත්මක කිරීමේ අරමුණ**

**I. <u>1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත</u> -**

ශ්‍රී ලංකාව තුල ඇති ශාක වලට හානිකර හෝ හිංසාකාරී හෝ විනාශකාරී වූ යම් ජීවියෙකු, ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට ද, ඒ තුල ව්‍යාප්ත කිරීමට ද එරෙහිව සහ ශ්‍රී ලංකාව තුල ඇති ශාක වල නිරෝගී බව ආරාක්ෂා කිරීම සඳහා ද (447 වන අධිකාරිය වූ) ශාක ආරක්ෂක ආඥාපනත ඉවත් කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

**II. <u>1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත</u>**

පළිබෝධනාශක ආනයනය, ඇසුරුම් කිරීම, සලකුණු කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය, අලෙවිය හා භාවිතය යන කරුණු නියාමනය කිරීම, පළිබෝධනාශක සඳහා බලපත්‍ර ලබා දීම, ඊට සම්බන්ධ හෝ ආනුෂාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

**III. <u>2003 අංක 22 දරන බීජ පනත</u>**

**බීජ හා රෝපන ද්‍රව්‍ය වල ගුණාත්මය විධිමත් කිරීම සඳහා ද** ඊට සම්බන්ධ හෝ ආනුෂාංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

**IV. <u>1951 අංක 25 දරන පස සංරක්ෂණය පිළිබඳ ආඥා පනත</u>**

පසේ ප්‍රයෝජනය සංරක්ෂනය කිරීම, පස සෝදායාම වැලැක්වීම හෝ අඩු කිරීම හා ගංවතුරෙන් හා නියගයෙන් වන හානි වලින් ඉඩම් ආරක්ෂා කර ගැනීම සඳහා විධිවිධාන යොදනු පිණිස පණව ලද ආඥා පනතකි.

**4. <u>1951 අංක 09 දරණ ගස් හෙලීම් (පාලන) පනත</u>**

ගස් හෙලීම තහනම් කිරීම, නියාමනය හෝ පාලනය කිරීම සඳහා වූ පනතකි.ගස් හෙලීම් පාලන පනත යටතේ එක් පුද්ගලයෙකු හෝ ආයතනයක් එක් වරකදී කොස් /දෙල් /ගැහැණු වර්ගයේ තල් ගස් 15 ට වඩා ඉවත් කර ගැනීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය.ඒ සඳහා පහත ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය.

1. අදාල අයදුම්කරු විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් අයදුම්පතක් ලබා ගැනීම.

2. එම අයදුම්පත සහ පහත ලිපිලේඛන ග්‍රාම නිලධාරීගේ නිර්දේශය සහිතව ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කිරීම.

- ඉඩමේ අයිතිය සනාථ කරන නිරවුල් ඔප්පුවේ පිටපත (හවුල් හෝ නොබෙදු ඉඩමක් නම් පාර්ශවකරුවන්ගේ කැමැත්ත ග්‍රාම නිලධාරී සහතික කල ලිපියක් මඟින් ඉදිරිපත් කල යුතුය)
- අදාල ගස් පිහිටි ඉඩමේ පිඹුරු පිටපත
- ඉඩමේ ප්‍රමාණය අක්කර 12.5 ට වැඩි නම් පරිසර වාර්තාව

3. ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය සහ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් එම අයදුම්පත දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කිරීම.

4. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය සහ දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය සහිතව එම අයදුම්පත කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීම.

5. ඉල්ලුම් කරන ලද කොස් /දෙල් /ගැහැණු වර්ගයේ තල් ගස් සංඛ්‍යාව මෙන් දෙගුණයක් කොස් /දෙල් /ගැහැණු වර්ගයේ තල් පැල සිටුවා දන්වන ලෙස අදාල අයදුම්කරු දැනුවත් කිරීම.

6. පැල සිටුවා ඇති බවට අදාල වාර්තාව ලද පසු කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් ගස් ඉවත් කර ගැනීමට ඉල්ලුම් කරන ලද සහ පැල සිටුවන ලද ක්ෂේත්‍රයේ නිරීක්ෂණ කටයුතු සිදු කිරීම.

7. එම ක්ෂේත්‍ර පරීක්ෂණයට අදාල නිරීක්ෂණ වාර්තාව අදාල ලිපිලේඛන සහිතව කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීම.

8. කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා දුන් පසු අදාල ගස් ඉවත් කිරීම සඳහා බලපත්‍ර ලබා දිය හැකි බව දිස්ත්‍රික් ලේකම් වෙත ලිඛිතව දැනුම් දීම.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | හෙලීමට අනුමැතිය ලබාදුන් ගස් ප්‍රමාණය |
|---|---|---|
| | | |
| | | |
| | | |

**5. දුම්කොළ වගාව වෙනුවට විකල්ප බෝග හදුන්වා දීම.**

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කරනු ලබන ආයතනය | වගකිය යුතු නිලධාරියා | වෙන්කළ ප්‍රතිපාදන (රු.මි) | දුම්කොල වගාවෙන් ඉවත්වන හෙක්ටයාර ගනන | ගොවීන් ගනන |
|---|---|---|---|---|---|---|
| මහනුවර මාතලේ | ගම්මිරිස් වගාව | අපනයන කෘෂිකරම දෙපාර්තමේන්තුව | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (මහනුවර) | 17.9966 | 50 | 50 |
| පොලොන්නරුව | විකල්ප බෝග වගාව (බඩ ඉරිගු, ලොකු ලූණු, රටකජු) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br><br>පොලොන්නරුව දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ ( පොලොන්නරුව) | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 34.15 | 428.947 | 1230 |
| කුරුණෑගල පුත්තලම | රතු ලූණු හා දෙමහුම් මිරිස් වගාව | පලාත් කෘෂි කර්ම දෙපාර්තමේන්තුව (වයඹ) | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ ( කුරුණෑගල)<br><br>නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ ( පුත්තලම) | 27.683 | 42.51 | 200 |